**විශේෂ සටහන 2**

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන - ප්‍රගතිය පිළිබඳ යාවත්කාලීන කිරීමක්

2022 වසරේ සිදු වූ ඓතිහාසික සමාජ-ආර්ථික හා දේශපාලන අර්බුදයෙන් පසුව සාර්ව ආර්ථික ස්ථායීතාවය, ණය තිරසාරභාවය සහ ලෝකය සමඟ සබඳතා යළි ගොඩනැංවීම සඳහා වන සාර්ව ආර්ථික ගැළපුම් වැඩසටහනක් හා සම්බන්ධ වූ මූල්‍ය වැඩපිළිවෙළක් ලබා ගැනීම පිළිබඳව ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ. අරමුදල) සමඟ සාකච්ඡා ආරම්භ කළේය. 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී, ජා.මූ. අරමුදලේ කාර්ය මණ්ඩලය සහ ශ්‍රී ලංකා බලධාරීන් විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) බිලියන 2.286ක (එ.ජ. ඩොලර් බිලියන 3ක් පමණ) විස්තීර්ණ ණය පහසුකම යටතේ මාස 48ක වැඩපිළිවෙළක් සඳහා කාර්යමණ්ඩල මට්ටමේ එකඟතාවයකට එළඹුණි. ඉන් අනතුරුව, ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ දහ හත් වැනි ජා.මූ. අරමුදල් වැඩසටහන ආරම්භ කිරීම සනිටුහන් කරමින් ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණවලට සහාය වීම සඳහා රජයට අයවැය ආධාර ලෙස, 2023 වසරේ මාර්තු මස 20වන දින විස්තීර්ණ ණය පහසුකම අනුමත කරන ලදී. ඒ අනුව, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි පළමු සහ දෙවන වාරික වශයෙන් සමස්ත වටිනාකම වි.ගැ.හි. මිලියන 508ක් (එ.ජ. ඩොලර් මිලියන 670ක් පමණ) පිළිවෙලින් 2023 වසරේ මාර්තු සහ දෙසැම්බර් මාසවල දී මුදා හරින ලදී. විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ දක්වා ඇති ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායක (Quantitative Performance Criteria - QPCs), අඛණ්ඩ කාර්යසාධන නිර්ණායක (Continuous Performance Criteria - CPCs), මුදල් ප්‍රතිපත්ති උපදේශන වගන්තිය (Monetary Policy Consultative Clause - MPCC), දර්ශක ඉලක්ක (Indicative Targets - ITs) සහ ව්‍යුහාත්මක මිණුම් දඬු (Structural Benchmarks - SBs) යනාදී නිර්ණායක භාවිතයෙන් ජා.මූ. අරමුදල සහ අදාළ බලධාරීහු විස්තීර්ණ ණය පහසුකමෙහි ප්‍රගතිය නිරන්තරයෙන් අධීක්ෂණය කරති. ශ්‍රී ලංකාව වෙනුවෙන් මෙම ඉලක්ක සපුරා ගැනීමේ වගකීම රජය සහ මහ බැංකුව වෙත පැවරී ඇත. වැඩසටහන් කාර්යසාධනය සම්බන්ධයෙන් ගත් කළ, 2023 වසරේ දෙසැම්බර් මස අවසානය සඳහා සමාජ වියදම් පිළිබඳ දර්ශක ඉලක්කය හැර සියලුම ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායක සහ දර්ශක ඉලක්ක සපුරා ඇති අතර, 2024 වසරේ පෙබරවාරි මස අවසානයට පෙර බොහෝ ව්‍යුහාත්මක මිණුම් දඬු සපුරාලීමට හෝ ප්‍රමාද වී සපුරා ගැනීමට හැකි විය. 2024 වසරේ මාර්තු මස 21වන දින ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ දෙවන සමාලෝචනය අවසන් කිරීම සඳහා ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ කාර්යමණ්ඩල මට්ටමේ එකඟතාවකට එළඹුණි. ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලය විසින් මෙම සමාලෝචනය අනුමත කළ පසු, ශ්‍රී ලංකාවට තවත් වි.ගැ.හි. මිලියන 254ක (එ. ජ. ඩොලර් මිලියන 337ක් පමණ) මූල්‍යකරණය සඳහා ප්‍රවේශය හිමිවනු ඇත.

ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ස්ථායීතාවය සහ රාජ්‍ය ණය තිරසාර බව යළි ඇති කිරීම සඳහා, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන ප්‍රධාන ප්‍රතිසංස්කරණ කිහිපයක් මත රැඳෙන විස්තරාත්මක ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ලෙස සැලසුම් කර ඇත. මෙම සාධක අතරට ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය, වඩාත් අවදානමට ලක්විය හැකි ජනතාව ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය ණය තිරසාරභාවය යළි ඇති කිරීම අරමුණු කර ගත් ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ උපාය මාර්ගයක්, මිල ස්ථායීතාවය යළි ඇති කිරීමේ බහු විධ උපාය මාර්ගයක් සහ වඩාත් නම්‍යශීලී විනිමය අනුපාතිකයක් යටතේ ජාත්‍යන්තර සංචිත යළි ගොඩනැගීම, මූල්‍ය අංශයේ ස්ථායීතාවය සුරැකීමේ ප්‍රතිපත්ති, පාලනය සහ දූෂණ අවදානම් සඳහා විසඳුම් ලබා දීම ඉලක්ක කරගත් ප්‍රතිසංස්කරණ සහ ආර්ථික වර්ධනය වැඩි දියුණු කරන පුළුල් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ඇතුළත් වේ.

දැනට පවතින ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ ප්‍රධාන ඉලක්ක සහ මූලිකාංග, පහත සාකච්ඡා කෙරේ.

**ශුද්ධ ජාත්‍යන්තර සංචිත ඉලක්කය**

ශුද්ධ ජාත්‍යන්තර සංචිත ඉලක්කය සංචිත සම්බන්ධ වගකීම් හැර මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන සංචිත මට්ටම මැන බැලීම සඳහා විස්තීර්ණ ණය පහසුකම යටතේ ඇති ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායකයක් වේ. මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් අඛණ්ඩව මධ්‍යස්ථ වීම, බහුපාර්ශ්වික ණය හිමියන්ට සිදු කරනු ලැබූ විදේශීය ණය සේවාකරණ ගෙවීම් සහ මූලික වශයෙන් වසර තුළ අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත සිදු කළ ශුද්ධ විකුණුම් හේතුවෙන් දළ නිල සංචිත සැලකිය යුතු ලෙස පහත වැටුණු බැවින් 2022 වසරේ සහ 2023 වසරේ මුල් කාලපරිච්ඡේදය තුළ දී සංචිත අඩු මට්ටමක පැවතුණි. වැඩසටහන ආරම්භයේ දී, එනම් 2023 වසරේ මාර්තු මස අවසානය වන විට, සංචිත සම්බන්ධ වගකීම් සංචිත වත්කම්වලට වඩා බෙහෙවින් වැඩි වූ නිසා ශුද්ධ ජාත්‍යන්තර සංචිත විශාල සෘණ මට්ටම්වල පැවතුණි. විස්තීර්ණ ණය පහසුකම යටතේ ශුද්ධ ජාත්‍යන්තර සංචිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමේ මූලික අරමුණ වනුයේ වගකීම් අභිබවා දළ

1

නිල සංචිත වත්කම් වැඩි වීම සහතික කිරීම සහ එමගින් ශුද්ධ ජාත්‍යන්තර සංචිත ධනාත්මක මට්ටම් වල පවත්වා ගැනීමයි. මේ දක්වා, විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් ශුද්ධ පදනමක් මත විදේශ විනිමය මිලදී ගනිමින් සංචිත ගොඩ නැගීම අඛණ්ඩව සිදු කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දළ නිල සංචිත මට්ටම ද 2022 වසර අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 1.9ක සිට 2023 වසර අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 4.4ක් පමණ දක්වාත්, 2024 වසරේ මාර්තු මාසය අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 5.0ක් පමණ දක්වාත් කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය.

**මහ බැංකුව විසින් රජයට ලබා දෙන ශුද්ධ ණය පිළිබඳ ඉලක්කය**

අතීතයේ පටන්, අනුප්‍රාප්තික රජයන් විසින් මූල්‍යන ලබා ගැනීම සඳහා මහ බැංකුව වෙත යොමු වීම, 2022 වසරේ දී උද්ධමනය සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමකට නැංවීමට බලපෑ ප්‍රධාන හේතුවක් විය. මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ණය සහ රජය විසින් මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන රුපියල් තැන්පතු අතර වෙනස මගින් මහ බැංකුවෙන් රජයට ලබා දුන් ශුද්ධ ණය ගණනය කරනු ලැබේ. ජා.මූ. අරමුදලේ වැඩසටහනට පෙර, රජයේ අයවැය හිඟය මූල්‍යනය කිරීමට මහ බැංකුවට නිරන්තරයෙන් සිදු විය. රජයට මහ බැංකුවෙන් මූල්‍ය පහසුකම් ලබා ගැනීමට හැකි ඕනෑම මාර්ගයක් වැළැක්වීම ජා.මූ. අරමුදලේ වැඩසටහනේ එක් ප්‍රධාන අරමුණක් වූ අතර, මෙය 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කිරීම හරහා සාක්ෂාත් කර ගන්නා ලදී. මහ බැංකුව විසින් රජයට අලුතින් මූල්‍යන සැපයීමකින් තොරව සහ මහ බැංකුවේ දැනට පවතින රජයේ සුරැකුම්පත් තොගය ක්‍රමානුකූලව අඩු කිරීම තුළින් ජා.මූ. අරමුදලේ වැඩසටහනට අනුව 2023 වසරේ දෙසැම්බර් අවසානය වන විට සපුරා ගත යුතුව තිබූ මහ බැංකුවෙන් රජයට ලබා දුන් ශුද්ධ ණය ඉලක්කය ද සාක්ෂාත් කර ගන්නා ලදී.

**මුදල් ප්‍රතිපත්ති උපදේශන වගන්තිය**

ශ්‍රී ලංකාවේ උද්ධමනය 2022 වසරේ දී ඉතිහාසයේ පෙර වාර්තා නොවූ ආකාරයේ ඉහළ මට්ටම් වාර්තා කළේය. දේශීය මිල ස්ථායීතාවය පවත්වා ගැනීමේ අරමුණට අනුකූලව ශ්‍රී ලංකාව ඉලක්කගත උද්ධමන මට්ටම සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා උද්ධමනයේ ප්‍රවණතා සමීපව නිරීක්ෂණය කිරීමට මුදල් ප්‍රතිපත්ති උපදේශන වගන්තිය පිහිටුවා ඇත. එය පෙර තීරණය කළ ඉලක්කගත දිනයන්හි දී කාර්තුමය උද්ධමනය නිරීක්ෂණය කරයි. ඒ අනුව, කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) (2021=100) මත පදනම්ව ගණනය කරනු ලබන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත කාර්තුමය සාමාන්‍ය උද්ධමනය, ජා.මූ. අරමුදලේ කාර්යමණ්ඩල වාර්තාවේ තාක්ෂණික අවබෝධතා ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති ක්‍රමවේදයට අනුව ගණනය කිරීමේ දී 2023 වසරේ දෙසැම්බර් මස වන විට සියයට 3.0ක් විය. එබැවින්, 2023 වසරේ දෙසැම්බර් මස වාර්තා කළ උද්ධමනය මුදල් ප්‍රතිපත්ති උපදේශන වගන්තියෙහි දක්වා ඇති සියයට 2.0-3.5 අතර පහළ බාහිර පරාසය තුළ පැවතියේය.

**ප්‍රාථමික ශේෂ ඉලක්කය, රාජ්‍ය ආදායම සහ සමස්ත අයවැය ශේෂය**

ශ්‍රී ලංකා රජයේ ආදායම එක් රැස් කිරීම ලොව පහළම ආදායම් එක් රැස් කිරීමේ මට්ටමක් ලෙස හඳුනාගෙන ඇති අතර ඉතිහාසය පුරාවට සැලකිය යුතු ප්‍රාථමික ශේෂ හිඟයකට හේතු වී ඇත. ශ්‍රී ලංකාව ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම, සමාජ ආරක්ෂණ ජාල, රාජ්‍ය ආයතන සහ රජය සතු ව්‍යවසායයන් සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ ඇති අවශ්‍යතා වන අතර, කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ රාජ්‍ය භාණ්ඩාගාරයට ඇති බලපෑම අඩු කිරීම ඒ තුළින් අරමුණු කර ගෙන ඇත. දැඩි රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්නයන්ගේ සහාය ඇතිව රජය විසින් 2023 වසර සඳහා ප්‍රාථමික අතිරික්තයක් වාර්තා කර ඇති අතර එය 2023 වසර සඳහා ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ ඉලක්කගත ප්‍රාථමික හිඟය සමඟ සැසඳීමේ දී ඉතා හිතකර තත්ත්වයකි. මේ අතර, 2023 වසරේ රාජ්‍ය වියදම ඉහළ ගිය ද රාජ්‍ය ආදායමේ සැලකිය යුතු ලෙස වැඩිවීම නිසා සමස්ත අයවැය හිඟය අඩු විය.

මීට අමතරව, රජයේ බදු ආදායම ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ දර්ශක ඉලක්කයක් ලෙස දක්වා ඇත. ජා.මූ. අරමුදලේ මෑතක දී අවසන් වූ වැඩසටහන් සමාලෝචනයේ දී බදු ආදායම් එකතු කිරීමේ කැපී පෙනෙන දියුණුව ඇගයීමට ලක් විය.

**අඛණ්ඩ කාර්ය සාධන නිර්ණායක සහ දර්ශක ඉලක්ක**

ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ අඛණ්ඩ කාර්ය සාධන නිර්ණායක දෙකක් නියම කර ඇත. මේ තුළ (i) මූල්‍ය නොවන රාජ්‍ය ආයතන සහ මහ බැංකුව විසින් විදේශ ගෙවීම්වලට අදාළව උපචිත අගයන් වාර්තා නොකිරීමට වග බලා ගැනීම සහ (ii) මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළඳපොළෙන් තවදුරටත් රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම් සිදු නොකිරීම ද ඇතුළත් වේ. වැඩසටහනේ මෙතෙක් පැවති මෙම අඛණ්ඩ කාර්ය සාධන නිර්ණායක ශ්‍රී ලංකා බලධාරීන් විසින් සපුරා ඇත. මීට අමතරව, මධ්‍යම රජයේ බදු ආදායම, මධ්‍යම රජයේ සමාජ වියදම්, ඉන්ධන සහ විදුලිය සඳහා වන වාණිජ නොවන වගකීම්වල පිරිවැය සහ භාණ්ඩාගාර ඇපකර සම්බන්ධ සීමාවන් යනාදිය සම්බන්ධ දර්ශක ඉලක්ක මෙම වැඩසටහන මගින් නියම කර ඇත. 2023 වසරේ

දෙසැම්බර් මස අවසානය වන විට සමාජ වියදම් හැර අනෙකුත් සියලුම දර්ශක ඉලක්ක, වැඩසටහන යටතේ රජය විසින් සපුරා ගන්නා ලදී.

**ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රගතිය**

ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම මගින් අපේක්ෂා කරන පරිදි තිරසාර මාවතක් කරා රාජ්‍ය ණය අඩු කිරීමේ දිශානතියකට යොමු කිරීමේ අරමුණින් විදේශීය ණය සඳහා සහන ලබා ගැනීමට රජය විසින් විදේශීය ණය හිමියන් සමග සාකච්ඡා කරමින් සිටියි. විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සැලකිය යුතු ප්‍රගතියක් ලබා ගෙන ඇත. 2023 වසරේ නොවැම්බර් මාසයේ දී, නිල ණය හිමියන්ගේ කමිටුව සමග බලධාරීන් ප්‍රතිපත්තිමය එකඟතාවකට එළඹුණු අතර, ශ්‍රී ලංකාව පිළිබඳ එහි වගකීම් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා චීන අපනයන-ආනයන බැංකුව ශ්‍රී ලංකාව සමග මූලික එකඟතාවකට ද එළඹුණි. දැනට, වැඩසටහන් පරාමිතීන් හා සැසඳිය හැකි ආකාරයෙන් ණය ගිවිසුම්වලට එළඹීම සඳහා ශ්‍රී ලංකාව නිල ණය හිමියන්ගේ කමිටුව සහ චීන අපනයන-ආනයන බැංකුව සමග සමීපව කටයුතු කරයි. මේ අතර, ශ්‍රී ලංකාව විදේශීය වාණිජ ණය හිමියන් සමග සාකච්ඡා තුළින් සහ තොරතුරු අඛණ්ඩව හුවමාරු කර ගැනීම තුළින් මනා විශ්වාසයෙන් යුතුව සමීපව කටයුතු කරමින් සිටින අතර, ණය සඳහා ගනු ලබන පිළියම් ක්‍රියාමාර්ග පිළිබඳව ඉක්මනින් එකඟතාවකට පැමිණීම අරමුණු කර ගෙන ඇත.

මීට අමතරව, රජය විසින් 2023 වසරේ ජූලි මාසයේ දී සිය දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන දියත් කරන ලද අතර, එහි මූලික කර්තව්‍යයන් 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී අවසන් කරන ලදී. ඉදිරිපත් කර ඇති ණය හුවමාරුව රජයේ අනාගත වාර්ෂික දළ මූල්‍යන අවශ්‍යතා තිරසාර මට්ටම්වලට අඩු කිරීමට දායක වන අතර රජයට සැලකිය යුතු ද්‍රවශීලතා සහනයක් ලබා දීමට යොමු විය.

**ප්‍රධාන ව්‍යුහාත්මක මිණුම් දඬු**

දැනට ක්‍රියාත්මක ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙහි රාජ්‍ය මූල්‍ය, රජය සතු ව්‍යවසායයන් සහ සමාජ ආරක්ෂණ ජාල ප්‍රතිසංස්කරණ, මූල්‍ය අංශය සහ පාලනය වැනි ක්ෂේත්‍රවල ව්‍යුහාත්මක මිණුම් අන්තර්ගත වේ. මෙම ව්‍යුහාත්මක මිණුම් දඬු සපුරා ගැනීම සම්බන්ධයෙන් මේ වන විට සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. මහ බැංකුවට අදාළ වන ප්‍රධාන ව්‍යුහාත්මක මිණුම් දඬු අතරට මහ බැංකු පනත බලාත්මක කිරීම, විශාලතම රාජ්‍ය බැංකු දෙක සහ විශාලතම පෞද්ගලික අංශයේ බැංකු තුන සඳහා බැංකු නිර්ණ කිරීමේ ව්‍යායාමයේ වත්කම්වල ප්‍රමිතිය සමාලෝචනය සම්පූර්ණ කිරීම, බැංකු පද්ධතියේ ප්‍රාග්ධනය සහ විදේශ විනිමය ද්‍රවශීලතා හිඟයන් සඳහා විසඳුම් සෙවීමට ඉදිරි දැක්ම සකස් කිරීම, සහ ප්‍රාග්ධනීකරණ සැලැස්මක් සකස් කිරීම ඇතුළත් වේ. තවද, බැංකු පනතේ සංශෝධන සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ප්‍රමාදයකින් වුවද ලබා ගන්නා ලදී. රජය සතු ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන්, පිරිවැය පිළිබිඹු කරන ඉන්ධන මිල නියම කිරීම සහ සූත්‍ර මත පදනම් වූ ගැළපීම් සමග විදුලි ගාස්තු තීරණය කිරීමේ රාමුවක් සැකසීම වැනි වැදගත් ව්‍යුහාත්මක මිණුම් දඬු සපුරා ඇත. ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වැනි දීර්ඝ කාලීනව පාඩු ලබන ආයතන ලාභදායී තත්ත්වයට වැඩි දියුණු වීමත් සමග මෙම උත්සාහයන් දැනටමත් සාර්ථක ප්‍රතිඵල පෙන්නුම් කර ඇත. 2024 වසරේ විසර්ජන පනතට පාර්ලිමේන්තු අනුමැතිය ලැබීම, රාජ්‍ය ඇපකරවල සීමාව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.5ක් දක්වා අඩු කිරීමට කැබිනට් අනුමැතිය ලබා ගැනීම, එකතු කළ අගය මත බදු (VAT) ආපසු ගෙවීමේ ක්‍රමයක් ගොඩනැගීමේ උපාය මාර්ගයක් සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීම සහ සරල කළ අගය එකතු කළ බද්ද (SVAT) සම්පූර්ණයෙන් ඉවත් කිරීම සහ බදු අනුකූලතාව සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුන්වා දීම රාජ්‍ය මූල්‍ය අංශයට සම්බන්ධ මේ වන විට සපුරා ඇති ව්‍යුහාත්මක මිණුම් දඬු කිහිපයකි.

**පාලනය**

ශ්‍රී ලංකාවේ තිරසාර සහ සැමට ප්‍රතිලාභ අත්වන ලෙස ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම සහතික කිරීම සඳහා දූෂණ අවදානම් සඳහා විසඳුම් සෙවීම ඉතා වැදගත් වේ. වැඩසටහනේ ප්‍රධාන කේන්ද්‍රීය ප්‍රතිසංස්කරණයක් වන පාලනය සහ දූෂණ විරෝධී ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙන යැමට ශ්‍රී ලංකාව කැපවී සිටී. මේ සම්බන්ධයෙන්, ජා.මූ. අරමුදලේ පාලන නිර්ණය පිළිබඳ ක්‍රියාවලිය සිදුකළ ආසියාවේ පළමු රට බවට පත් වෙමින් ශ්‍රී ලංකාව 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී පාලන නිර්ණ වාර්තාව ප්‍රකාශයට පත් කළේය. තවද, පාලන නිර්ණ වාර්තාවේ ප්‍රධාන නිර්දේශ ක්‍රියාවට නැංවීම සඳහා ශ්‍රී ලංකාව විසින් ක්‍රියාකාරී සැලැස්ම මෑතක දී ප්‍රකාශයට පත් කරන ලද අතර, මෑතක දී අවසන් වූ සමාලෝචනයේ දී ජා.මූ. අරමුදල විසින් මෙය ඇගයීමට ලක් කරන ලදී. දූෂණ අවදානම් පිළිබඳ අවධානය යොමු කිරීම, ආර්ථිකය පිළිබඳ විශ්වාසය යළි ගොඩනැංවීම සහ ආර්ථික වර්ධනය වඩාත් ශක්තිමත් සහ සැමට ප්‍රතිලාභ අත්වන ආකාරයෙන් සිදු වීම සඳහා මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට තිරසාර ප්‍රයත්නයන්ගේ අවශ්‍යතාවය ජා.මූ. අරමුදල විසින් අවධාරණය කර ඇත.